කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2019

**HIS 3173 - පුරාතන ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය**

පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03)පමණක් පිළිතුරු සපයන්න.**

---

01. i) තාක්ෂණය යනු කුමක්ද?

ii) ශ්‍රී ලංකාවට ආවේණික තාක්ෂණයක් නිර්මාණය වීම කෙරෙහි භූගෝලීය සැකැස්ම හා භූ පරිසරය බලපෑ ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

02. චෛත්‍ය නිර්මාණ තාක්ෂණයට පදනම් වූ වාස්තු විද්‍යාත්මක හා ජ්‍යෝතිෂ්‍ය විද්‍යාත්මක සාධක රූප සටහන් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

03. මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ දී පැරණි ශ්‍රී ලාංකිකයන් අනුගමනය කළ ක්‍රමවේදය පාංශු නිර්ණය, පිළිස්සුම් ක්‍රමය හා වර්ණ භාවිතය යන මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.

04. ශිෂ්ටාචාරයක දියුණුව හා ගුණාත්මක භාවය නිර්ණය කිරීමේ දී යකඩ තාක්ෂණය තීරණාත්මක සාධකයක් වන්නේ කෙසේදැයි ලංකාවේ පුරාතන ශිෂ්ටාචාරය ඇසුරෙන් විමසන්න.

05. වැව් නිර්මාණය කිරීමේ දී පැරැන්නන් විසින් ස්වභාවික පරිසරය කෙරෙහි දක්වනු ලැබූ සංවේදීතාව තාක්ෂණය ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. පහත සඳහන් ඕනෑම දෙකක් ගැන (02) කෙටි සටහන් ලියන්න.

i. පැරණි ලංකාවේ නැව් නිර්මාණ තාක්ෂණය

ii. අනාගමික ගොඩනැගිලි ඉදි කිරීම හා අමුද්‍රව්‍ය භාවිතය

iii. දිය කැට පහන

iv. ගල් පාලම් ඉදි කිරීම